දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය / எனது இல. / My No.: PSC/ADM/02/04/55(II)
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.08.2

අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

<u>බදාදා දිනවල මහජන දිනය ක්‍රියාත්මක කිරීම - රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ මහජන දිනය 2023.11.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි සෑම සතියකම බදාදා දිනවල දී පැවැත්වීමට එම කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද අතර, ඒ බව කාර්යාලීය නිල වෙබ් අඩවියේ "නවතම දැන්වීම්" යටතේ සියලු රාජ්‍ය ආයතන දැනුවත් කරන ලදී.

02. සියලුම රාජ්‍ය ආයතනවල සඳුදා දින මහජන දිනය ක්‍රියාත්මක වන බැවින් හා එම දිනවල සියළු රාජ්‍ය නිලධාරීන් ඊට සහභාගීවීම සඳහා සිය කාර්යාලවල රැඳී සිටිය යුතු බව නිරීක්ෂණය වූ බැවින්, මෙම කාර්යාලයේ සේවාලාභීන් බහුතරයක් රාජ්‍ය නිලධාරීන් වන බැවින් විවිධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු එම නිලධාරීන්ගේ පහසුව සලකා මෙම තීරණය ගෙන ඇති බව දන්වමි.

03. එසේ වුවද මේ වන විටත් රාජ්‍ය නිලධාරීන් සඳුදා දිනවල මෙම කාර්යාලය වෙත සිය අවශ්‍යතා සඳහා පැමිණෙන බැවින්, මින් ඉදිරියට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මහජන දිනය බදාදා දිනවල පමණක් පැවැත්වෙන බව ඔබ ආයතනයේ සියලු රාජ්‍ය නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.